ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා ගෞරව උපාධි වැඩසටහන
පස්වන මට්ටම - 2021/2022
අවසාන පරීක්ෂණය 2022
STU5314/STU5328 - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය
කාලය -පැය තුනයි. (03)

---

දිනය - 2022.12.03 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. මාර්ගෝපදේශය යන සංකල්පය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

02. සමායෝගී වීම සහ මානසික සෞඛ්‍යය අතර ඇති සම්බන්ධතාව කුමක් දැයි උදාහරණයක් ඇසුරින් පැහැදිලි කරන්න.

03. පාසල් උපදේශන ක්‍රියාවලිය තුළ රහසිගතභාවය සුරැකීම පිළිබඳ ආචාරධර්මය වැදගත් වන්නේ මන් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

04. පාසල් වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවාවක් තුළින් ශිෂ්‍යයින් තුළ සංවර්ධනය කළ යුතු කුසලතා පහක් (05) සඳහන් කරන්න.

05. පාසල් පද්ධතිය තුළ උපදේශන සේවා ශිල්ප ක්‍රම භාවිතයේ ප්‍රයෝජන පහක් (05) සඳහන් කරන්න.

06. එලි ගින්ස්බර්ග්ගේ වෘත්තීන් තේරීම පිළිබඳ න්‍යායෙහි එන අත්හදා බැලීමෙන් තේරීම් කරන අවධිය පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න.

07. පාසල් ශිෂ්‍යයන් හට උපදේශනය සැපයීමෙහි දී ප්‍රතිකාරාත්මක ප්‍රවේශයක් ලෙස මනෝවිශ්ලේෂණාත්මක ප්‍රවේශයෙහි ඇති ප්‍රබලතා හා සීමා දක්වන්න.

08. ගුරුවරයා විසින් ද්විතියික පාසල් ශිෂ්‍යයන් හට සමායෝගී පෞරුෂ ගොඩනඟා ගැනීම සඳහා ඔවුන්ගේ චිත්තවේගී ප්‍රකාශනයට අවස්ථා සලසා දිය හැකි ආකාර දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) "ශිෂ්‍යයකු හට සමායෝගී පෞරුෂයක් ගොඩනගා ගැනීමට කාංසා අක්‍රමතා ආශ්‍රිත සාධක බාධාකාරී විය හැක."

පුද්ගල සමායෝගී බවට බාධාකාරී විය හැකි වෙනත් සාධක වර්ග හතරක් (04) සඳහන් කරන්න. ( 1 x 4 = ලකුණු 04)

(ii) ඔබ ඉහත සඳහන් කළ එක් (01) සාධක වර්ගයක් තෝරා ගෙන එය පුද්ගල සමායෝගී බවට බාධාකාරී වන ආකාරය උදාහරණ දෙකක් (02) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 04)

(iii) කාංසා අක්‍රමතා ආශ්‍රිත සාධක හේතුවෙන් සමායෝගී බවට බාධා ඇති වී තිබෙන ශිෂ්‍යයෙකු හට සමායෝගී පෞරුෂයක් සංවර්ධනය ළඟා කර ගැනීම සඳහා ගුරුවරයෙකු විසින් උපකාර කළ හැක්කේ කෙසේ දැයි ප්‍රධාන කරුණු හතරක් (04) ඔස්සේ පහදන්න. (ලකුණු 12)

10. (i) වර්තමාන ශ්‍රී ලංකාවේ පාසල් පද්ධතිය තුළ මාර්ගෝපදේශය හා උපදේශනය සඳහා අවශ්‍යතාවයක් නිර්මාණය වීමට තුඩු දී ඇති ප්‍රධාන සාධක හතරක් (04) සඳහන් කරන්න. ( 1 x 4 = ලකුණු 04)

(ii) ඔබ ඉහත තෝරා ගත් සාධකයෙහි බලපෑම හේතුවෙන් උපදේශනය අවශ්‍ය වී සිටින ශිෂ්‍යයෙකු හට පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව තුළින් උපකාර කළ හැකි ආකාරය ප්‍රධාන කරුණු තුනක් (03) ඔස්සේ සාකච්ඡා කරන්න. (ලකුණු 09)

(iii) ඔබ ඉහත සඳහන් කළ ආකාරයට ක්‍රියා කිරීමේ දී පාසල් උපදේශකවරයෙකුට මුහුණ දීමට සිදු විය හැකි අභියෝගයක් සහ එය ජය ගැනීමට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ගයක් පැහැදිලි කරන්න. (ලකුණු 07)

11. (i) පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාව හා සම්බන්ධ මූලික ක්‍රියාවලි හතරක් (04) නම් කරන්න. ( 1 x 4 = ලකුණු 04)

(ii) "පාසල් මාර්ගෝපදේශ හා උපදේශන සේවාවක් නම්‍ය විය යුතුය."
සුදුසු උදාහරණ දක්වමින් ඉහත සඳහන් ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) විමධ්‍යගත පාසල් මාර්ගෝපදේශන හා උපදේශන සේවාවක් පවත්වා ගෙන යාමෙහි දී පිළිවෙළින් විදුහල්පතිගේ සහ ගුරුවරුන්ගේ භූමිකාව හා වගකීම් මොනවා දැයි සුදුසු උදාහරණ තුනක් (03) බැගින් දක්වමින් පැහැදිලි කරන්න. ( 6 x 2 = ලකුණු 12)

12. (i) උදාහරණ දක්වමින් "හැසිරීම් ගැටළු" යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) සමාජයීය වශයෙන් නිශ්ක්‍රමණීය ශිෂ්‍යයෙකුගේ ලක්ෂණ දෙකක් (02) කෙටියෙන් විස්තර කරන්න. ( 2 x 2 = ලකුණු 04)

(iii) මුහුණුපොත (Facebook), ජංගම දුරකථන සහ අන්තර්ජාලය භාවිතා කිරීමෙහි දී නවයොවුන් වියෙහි පසුවන ශිෂ්‍යයින් ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳව ගුරුවරයෙකු වශයෙන් ශිෂ්‍යයින්ට මඟ පෙන්වීම සඳහා ඔබ විසින් යොදා ගත හැකි උපායමාර්ග හතරක් (04) සාකච්ඡා කරන්න. ( 4 x 3 = ලකුණු 12)

13. (i) මන්ද මානසික ළමුන් හඳුනා ගැනීමට යොදා ගත හැකි ඔවුන්ගේ ලක්ෂණ හතරක් (04) ලැයිස්තු ගත කරන්න. ( 1 x 4 = ලකුණු 04)

(ii) ගුරුවරයෙකු විසින් මන්ද මානසික ළමුන්ගේ සංවර්ධනය සඳහා සහාය වීමට යොදා ගත හැකි උපායමාර්ග හතරක් (04) කෙටියෙන් සාකච්ඡා කරන්න. ( 2 x 4 = ලකුණු 08)

(iii) ඔබ ඉහත සඳහන් කළ උපායමාර්ග අනුගමනය කිරීමේ දී ගුරුවරයෙකුට මුහුණ දීමට සිදු වන අභියෝග දෙකක් (02) සඳහන් කර එම අභියෝග ජය ගැනීමට යොදා ගත හැකි ක්‍රියාමාර්ගයක් බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.